# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 13,309 — 1962 සැප්තැම්බර් 21 වැනි සිකුරාද — 1962.9.21

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදි)


## I වැනි කොටස: (I) වැනි ඡේදය — සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි, සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොද ඇත.)


| | පිට |
|---|---|
| අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන ප්‍රකාශන ආදිය ... ... | — |
| අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත් කිරීම් ආදිය ... | 1343 |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් ආදිය ... | 1344 |
| අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් ආදිය ... | 1344 |
| වෙනත් පත් කිරීම් ආදිය ... ... ... | 1345 |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත් කිරීම් ආදිය ... ... | — |
| ආණ්ඩුවේ නිවේදන ... ... ... | 1346 |
| මිළ පාලන දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... | — |
| ආණ්ඩුවේ වත් කම් හා බැරකම් ප්‍රකාශ ... ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... | 1347 |
| "සුරාබද්ද ආඥාපනත" පිළිබඳ දැන්වීම් ... ... | — |


## අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත්කිරීම් ආදිය

1962 අංක 392

අංකය : ඞී. 197/රෙක්ට්.

### යුද්ධ හමුදාව—නිත්‍ය හට සේනාව—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද මාරු කිරීමක් හා පත් කිරීමක්

**මාරු කිරීම**

1962 අගෝස්තු මස 22 වැනි දින සිට ලංකා සංඥා බලකායට මාරු කිරීම :—

තාවකාලික මේජර් සිසිල් තියඩෝර් කල්දේරා, ල. පා. හ.

**පත් කිරීම**

1962 අගෝස්තු මස 22 වැනි දින සිට ලංකා සංඥා බලකායේ වැඩ බලන අණ දෙන නිලධාරී වශයෙන් :—

තාවකාලික මේජර් සිසිල් තියඩෝර් කල්දේරා, ල. ස. බ.

උතුමාණන් වහන්සේගේ අණපරිදි.

මො. වි. ජේපා. අබයකෝන්,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ
වැඩබලන ස්ථිර ලේකම්.

1962 සැප්තැම්බර් 14 වෙනි දා,
කොළඹදීය.

9-791

1962 අංක 393

අංකය : ඞී/වීඑජ්/18/ඒ.

### රාජකීය ලංකා ස්වේච්ඡා නාවික හට හමුදාව—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද උසස් කිරීම්

1962 ජූලි මස 1 වැනි දින සිට ලයිතන් වරුන් වශයෙන් :—

උප ලයිතන් ඩබ්ලිව්. ඇම්. ඇන්. ද සිල්වා—රා. ලං. ස්වේ.නා.හ.

උප ලයිතන් වී. ඒ. ජේ. මැන්දිස්—රා. ලං. ස්වේ. නා. හ.

උප ලයිතන් ඇල්. ඇල්. ඒ. පීරිස්—රා. ලං. ස්වේ. නා. හ.

උප ලයිතන් කෝ. ඇල්. ඒ. ප්‍රනාන්දු—රා. ලං. ස්වේ. නා. හ.

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

මො. වි. ජේපා. අබයකෝන්,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ
වැඩ බලන ස්ථිර ලේකම්.

1962 සැප්තැම්බර් 12 වෙනි දා,
කොළඹදීය.

9-794

### විශේෂ නිවේදනයයි

1962 සැප්තැම්බර් මස 26 වෙනි බදාදා ආණ්ඩුවේ නිවාඩු දිනයක් වන බැවින්, 1962 සැප්තැම්බර් 28 වැනි දින නිකුත් කරනු ලබන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා එවන සියළුම දැන්වීම් සහ නිවේදන, 1962 සැප්තැම්බර් 22 වැනි සෙනසුරාදා දවල් 12 ට ප්‍රථම ආණ්ඩුවේ මුද්‍රණාලයට ලැබෙන්නට සැලැස්විය යුතු බව කාගේත් දැන ගැනීම සඳහා මෙයින් නිවේදනය කරමි.

බර්නාඩ් ද සිල්වා,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1962 සැප්තැම්බර් 14 දින,
ආණ්ඩුවේ මුද්‍රණාලය,
කොළඹ.

# රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් කරන පත්කිරීම් ආදිය

**1962 අංක 394**

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පහත සඳහන් පත්කිරීම් කරන ලෙස නියමකර ඇත්තේ ය:—

ඒ. 55/62.

දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ තක්සේරුකරුවන් වන ඩබ්ලිව්. රාජේන්ද්‍ර, ඇස්. ජේ. වේදනායගම්, එච්. ඊ. ඩබ්ලිව්. සොලමන්ස් සහ ඇම්. බී. ජේ. සිල්වා යන මහතුන් පිළිවෙලින් 1962 ජූනි මස 14, 1962 ජූනි මස 14, 1962 ජූලි මස 17 සහ 1962 ජූලි මස 17 යන දිනයන්හි සිට එම දෙපාර්තමේන්තුවේ සහකාර කොමසාරිස්වරුන් ලෙස වැඩ බැලීමට.

දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ තක්සේරුකරුවන් වන වී. ඇල්. වී. පෙරේරා සහ ඇල්. ඕ. ද සිල්වා යන මහතුන් 1962 ජූනි මස 14 වැනි දින සිට එම දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ තක්සේරුකරුවන් ලෙස වැඩ බැලීමට.

දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ තක්සේරුකරුවන් වන ඒ. ඇල්. ජේ. ද ඇස්. විජේරත්න සහ වී. සුප්පයියා යන මහතුන් 1962 ජූලි මස 17 වැනි දින සිට එක් වසක කාලයක් තුළ එම දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ තක්සේරුකරුවන් ලෙස වැඩ බැලීමට.

දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ සහකාර තක්සේරුකරුවන් වන කේ. සිරිවර්ධන මහත්මිය, සී. ද ඒ. ගුණවර්ධන, ඩී. සී. ඇම්. වෛද්‍යසේකර සහ පී. කාරාලසිංහම් යන මහතුන් පිළිවෙලින් 1962 ජූනි මස 14, 1962 ජූනි මස 14, 1962 ජූලි මස 17 සහ 1962 ජූලි මස 17 යන දිනයන්හි සිට එම දෙපාර්තමේන්තුවේ තක්සේරුකරුවන් ලෙස රාජ්‍ය කාර්යයන්හි යෙදීමට.

දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ සහකාර තක්සේරුකරුවන් වන ආර්. ඕ. ගනේෂනාදන් සහ පී. රත්නසුන්දරම් යන මහතුන් 1962 පෙබරවාරි මස 6 වැනි දින සිට එම දෙපාර්තමේන්තුවේ තක්සේරුකරුවන් ලෙස.

දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ සහකාර තක්සේරුකරු ඒ. සී. ඇස්. පෙරේරා මහතා 1962 පෙබරවාරි මස 24 වැනි දින සිට එම දෙපාර්තමේන්තුවේ තක්සේරුකරු ලෙස වැඩ බැලීමට.

ඇන්. පී. විජයරත්න,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1962 සැප්තැම්බර් මස 17 වැනි දින,
කොළඹ 1, ගාලු මුවදොර මහලේකම් ගොඩනැගිල්ලේ,
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේදිය.
නැ. පෙ. 500.

9-802

---

# අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් කරන පත්කිරීම් ආදිය

**1962 අංක 395**

අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් පහත සඳහන් පත් කිරීම් කර ඇත්තේ ය:—

අංකය : ජේඒ. 49/48 (III).

එන්. සිවඥානසුන්දරම් මහතා ඔහුගේ වෙනත් රාජකාරිවලට අතිරේක වශයෙන් 1962 සැප්තැම්බර් 8 වැනි දින සිට, පේදුරුතුඩුවේ දිස්ත්‍රික් උසාවියේ අංක 6169 දරණ නඩුවේ තීන්දුව දීමට හා පේදුරුතුඩුවේ දිස්ත්‍රික් උසාවියේ අංක 6371, 6491, 6957 සහ 7113 දරණ නඩු අවසාන වන තුරු ඇසීමට හා තීන්දු දීමට, පේදුරුතුඩුවේ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඒ. 57/48.

කේ. සින්නතම්බි මහතා ඔහුගේ වෙනත් රාජකාරිවලට අතිරේක වශයෙන් 1962 සැප්තැම්බර් 5 වැනි දින සිට, වවුනියාවේ මහෙස්ත්‍රාත් උසාවියේ අංක 36269, 36273, 36274, 36275 සහ 36276 දරණ නඩු අවසාන වන තුරු ඇසීමට හා තීන්දු දීමට වවුනියාවේ, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා වවුනියාවේ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 35බී/61.

ඩී. ඩබ්ලිව්. කේ. ලද්දුවහෙට්ටි මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ජේ. එන්. සී. තිරුචෙල්වම් මහතා 1962 සැප්තැම්බර් 7 වැනි දින, කොළඹ, අතිරේක නාගරික මහෙස්ත්‍රාත් ධුරයට හා කොළඹ, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට.

අංකය : ජේඑල්. 52ඒ/60.

බී. එස්. සී. රත්වත්තේ සහ එම්. හුසේන් යන මහතුන් නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ඒ. එම්. එම් තාහිර් මහතා 1962 සැප්තැම්බර් 8 වැනි දින සිට 10 වැනි දින දක්වා, ගාල්ලේ, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, ගාල්ලේ, අතිරේක නාගරික මහෙස්ත්‍රාත් ධුරයට හා ගාල්ලේ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 7ඒ/51 (I).

ඒ. ඕ. එස්. දිසානායක මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එස්. පී. විජේතිලක මහතා 1962 සැප්තැම්බර් 6 වැනි දින සිට 11 වැනි දින දක්වා, මාතලේ පිහිටි උසාවියේ ක්‍රියා කරන පිණිස, මහනුවර, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට හා මාතලේ, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට.

අංකය : ජේඑල්. 68බී/50.

ඩබ්ලිව් ඒ. වෝල්ටන් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, සී. සී. සෝමසේගරම් මහතා 1962 සැප්තැම්බර් 13 වැනි දින සිට 17 වැනි දින දක්වා, යාපනේ, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, යාපනේ, අතිරේක නාගරික මහෙස්ත්‍රාත් ධුරයට, කයිට්ස්, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට හා යාපනේ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඒ 8/48.

ජේ. ජේ. ඩේවිඩ් මහතා 1962 ඔක්තෝබර් 20 වැනි දින සිට, මඩකලපුවේ මහෙස්ත්‍රාත් උසාවියේ අංක 3110 දරණ නඩුව අවසාන වන තුරු ඇසීමට හා තීන්දුව දීමට, මඩකලපුවේ, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට, හා මඩකලපුවේ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 63ඒ/58.

ජේ. ජී. එල්. සුවාරිස් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එල්. වී. බී. ද ජැකොලයින් මහතා 1962 සැප්තැම්බර් 15 වැනි දින, අවිස්සාවේල්ලේ, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට හා අවිස්සාවේල්ලේ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 68සී/51.

සී. වී. උදලාගම මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එච්. ඒ. ජයවික්‍රම මහතා 1962 සැප්තැම්බර් 12 වැනි හා 21 වැනි දිනයන්හි, අනුරාධපුරේ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, අනුරාධපුරේ, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, මන්නාරමේ හා වවුනියාවේ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, වවුනියාවේ, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට, ත්‍රිකුණාමලේ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට හා ත්‍රිකුණාමලේ, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට.

අංකය : ජේඑල් 12ඒ/57.

කේ. සී. ඊ. ද අල්විස් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ජේ. අමරසිංහ මහතා 1962 සැප්තැම්බර් 13 වැනි දින, තංගල්ලේ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, තංගල්ලේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට හා හම්බන්තොට, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට.

අංකය : ජේඑල්. 12ඒ/57.

කේ. සී. ඊ. ද අල්විස් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එන්. එම්. ඒ. වික්‍රමසූරිය මහතා 1962 සැප්තැම්බර් 12 වැනි හා 13 වැනි දිනයන්හි, තංගල්ලේ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, තංගල්ලේ, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට හා හම්බන්තොට, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට.

අංකය : පීඑල්/එස්. 7/49.

කේ. සින්නතම්බි මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එෆ්. එස්. පෝල් මහතා 1962 සැප්තැම්බර් 9 වැනි හා 10 වැනි දිනයන්හි, මන්නාරමේ, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට හා මන්නාරමේ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : පීඑල්/එස්. 7/49.

කේ. සින්නතම්බි මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එෆ්. එස්. පෝල් මහතා 1962 සැප්තැම්බර් 10 වැනි හා 11 වැනි දිනයන්හි මන්නාරම දිස්ත්‍රික්කයේ මන්නාරම ගම්බද උසාවි සභාපති ධුරයේ වැඩ බැලීමට.

අංකය : පීඑල්/ඒ.5/53.

ඒ. බී. අළුවිහාරේ මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ඩී. සී. විජේසිංහ මහතා 1962 සැප්තැම්බර් 14 වැනි හා 15 වැනි දිනයන්හි, අවිස්සාවේල්ල දිස්ත්‍රික්කයේ දෙහිගම්පල් කෝරළේ හා පාත බුලත්ගම සහ අතුළුගම් සහ පනාවල් කෝරළයන්හි ගම්බද උසාවි සභාපති ධුරයේ හා බෙලිගල් සහ කුරුවිටි කෝරළයන්හි ගම්බද උසාවි අතිරේක සභාපති ධුරයේ වැඩ බැලීමට.

අංකය : පීඑල්/ඩබ්ලිව්.10/53.

ටී. බී. වැත්තෑව මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ඒ. ඩබ්ලිව්. ඒ. ඉමැනුවෙල් මහතා 1962 සැප්තැම්බර් 12 වැනි හා 13 වැනි දිනයන්හි කුරුණෑගල දිස්ත්‍රික්කයේ දේවමැදි හත්පත්තුවේ ගම්බද උසාවි සභාපති ධුරයේ හා වන්නි හත්පත්තුවේ, කටුගම්පොල හත්පත්තුවේ සහ හිරියාල හත්පත්තුවේ ගම්බද උසාවි අතිරේක සභාපති ධුරයේ වැඩ බැලීමට.

අංකය : පීඑල්/ඩී.10/62.

සී. ජී. එල්. ද අල්විස් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, බී. පී. පියසේන මහතා 1962 සැප්තැම්බර් 6 වැනි දින සිට 8 වැනි දින දක්වා හා 10 වැනි දිනද, මාතර දිස්ත්‍රික්කයේ වැල්ලබොඩ පත්තුවේ, කඩවත් සතරේ සහ වැලිගම් කෝරළේ ගම්බද උසාවි සභාපති ධුරයේ හා ගඟබොඩ පත්තුවේ ගම්බද උසාවි අතිරේක සභාපති ධුරයේ වැඩ බැලීමට.

ඇන් ඒ. ද ඇස්. විජේසේකර,
අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1962 සැප්තැම්බර් 13 වැනි දින,
අධිකරණ සේවා කොමිෂන් සභා කාර්යාලය,
තැ. පෙ. අංකය : 573,
කොළඹ 12,

9-639

---

# වෙනත් පත්කිරීම් ආදිය

## 1962 අංක 396

(20 වෙනි පරිච්ඡේදය වන) ක්‍රිමිනල් නඩු විධාන සංග්‍රහයේ 120 වෙනි වගන්තිය යටතේ ගරු අධිකරණ ඇමතිතුමා විසින්—

අංකය : අයි. එන්. කපු/එල් 1/3/57

1962 අගෝස්තු මස 11 වෙනි දින සිට එල්. පී. ඊ. කරුණාරත්න මහතා නැවත වැඩභාරගන්නා තුරු කොළඹ දිස්ත්‍රික්කයේ මීගමු නගර කොට්ඨාශයේ හදිසි මරණ පරීක්ෂක ධුරයෙහි වැඩ බැලීමට ක්‍රිස්ටි ද ක්‍රෑස් මහතාද,

අංකය : අයි. එන්. කපු/එල් 1/1/62

1962 අගෝස්තු මස 12 වෙනි දින සිට එම්. ජස්ටින් ද සිල්වා මහතා නැවත වැඩභාරගන්නා තුරු කොළඹ දිස්ත්‍රික්කයේ කඳවල, කටාන ප්‍රදේශයේ හදිසි මරණ පරීක්ෂක ධුරයෙහි වැඩබැලීමට එල්. ඒ. ගනේපොල මහතාද,

අංකය : අයි. එන්. කපු/එල් 2/3/58

1962 අගෝස්තු මස 9 වෙනි දින සිට ටී. ඩී. ජේ. ඖෂධරත්න මහතා නැවත වැඩභාරගන්නා තුරු කළුතර දිස්ත්‍රික්කයේ ගල්පාත ප්‍රදේශයේ හදිසි මරණ පරීක්ෂක ධුරයෙහි වැඩබැලීමට පී. ඩී. එල්. ගුණවර්ධන මහතා ද,

අංකය : අයි. එන්. කපු/එල් 2/1/62

1962 අගෝස්තු මස 17 වෙනි දින සිට එච්. ඒ. පී. විජේසේකර මහතා නැවත වැඩ භාරගන්නාතුරු පානදුර දිස්ත්‍රික්කයේ වාද්දුව කොට්ඨාශයේ හදිසි මරණ පරීක්ෂක ධුරයෙහි වැඩ බැලීමට එම්. ඩී. එස්. ජයවර්ධන මහතා ද,

අංකය : අයි. එන්. කපු/එල් 3/6/62

1962 අගෝස්තු මස 18 වෙනි දින සිට ඩී. ඇම්. අබේසේකර මහතා නැවත වැඩ භාරගන්නාතුරු මහනුවර දිස්ත්‍රික්කයේ යටිනුවර ගඟපලාත කෝරළේ හදිසි මරණ පරීක්ෂක ධුරයෙහි වැඩබැලීමට ඇල්. ඒ. ආර්. එම්. අන්සාරි මහතා ද,

අංකය : අයි. එන්. කපු/එල් 3/5/62.

1962 අගෝස්තු මස 21 වෙනි දින සිට ඇම්. මොහොට්ටි මහතා නැවත වැඩ භාරගන්නා තුරු මහනුවර දිස්ත්‍රික්කයේ මැදදුම්බර දකුණු පළාත කෝරළේ හදිසි මරණ පරීක්ෂක ධුරයෙහි වැඩ බැලීමට අයි. ඇල්. ආර්. පුංචිබණ්ඩාර මහතාද,

අංකය : අයි.එන්.කපු/එල් 9/2/57.

1962 අගෝස්තු මස 16 වෙනි දින සිට කේ. රාමනාදන් මහතා නැවත වැඩ භාරගන්නා තුරු යාපනේ දිස්ත්‍රික්කයේ ඩෙල්ෆ්ට්, කයිට්ස්හි හදිසි මරණ පරීක්ෂක ධුරයෙහි වැඩ බැලීමට ඊ. යතවරායර් මහතාද,



අංකය : අයි.එන්.කපු/එල් 11/1/57.

1962 අගෝස්තු මස 13 වැනි දින සිට ජේ. වී. පෙල්ඩානෝ මහතා නැවත වැඩ භාරගන්නා තුරු මන්නාරම් දිස්ත්‍රික්කයේ පේසාලෙයි කොට්ඨාශයේ හදිසි මරණ පරීක්ෂක ධුරයෙහි වැඩබැලීමට ඊ. බී. පෙල්ඩානෝ මහතාද,

අංකය : අයි.එන්.කපු/එල් 11/1/57.

1962 අගෝස්තු මස 25 වෙනි දින සිට කේ. කේ. එස්. හබීබු මොහමඩ් මහතා නැවත වැඩ භාරගන්නා තුරු මන්නාරම් දිස්ත්‍රික්කයේ ඉරුක්කුලම්පිඩ්ඩි ප්‍රදේශයේ හදිසි මරණ පරීක්ෂක ධුරයෙහි වැඩබැලීමට කේ. කේ. මාපිලෙයි මරික්කාර් මහතාද,

අංකය : අයි.එන්.කපු/එල් 18/2/62.

1962 අගෝස්තු මස 14 වෙනි දින සිට එච්. එච්. ඇන්. සිල්වා මහතා නැවත වැඩ භාරගන්නා තුරු බදුල්ල දිස්ත්‍රික්කයේ යටිපළාත කොට්ඨාශයේ හදිසි මරණ පරීක්ෂක ධුරයෙහි වැඩබැලීමට ආර්. බී. මුල්ලේගම මහතාද,

අංකය : ඒ.අයි. 9/1/57.

1962 ජූලි මස 16 වෙනි දින සිට යාපනය දිස්ත්‍රික්කයේ, ඩෙල්ෆ්ට් කොට්ඨාශයේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි ධුරයේ වැඩබලන කාලය තුළ එම කොට්ඨාශයේ පරීක්ෂකවරයෙකු වශයෙන් ජෝන් සුබ්‍රමානියම් සෙල්ලයියා අනන්තම් මහතාද,

අංකය : ඒ.අයි. 14/9/51.

1962 අගෝස්තු මස 11 වෙනි දින සිට ස්ථිර පත්කිරීමක් කරන තුරු කුරුණෑගල දිස්ත්‍රික්කයේ වැළඩ කෝරළේ හදිසි මරණ පරීක්ෂක ධුරයෙහි වැඩබැලීමට ඩී. ඇම්. ඩිංගිරිබණ්ඩා මහතාද,

පත්කර ඇත්තේ ය.

ඩී. ජේ. ආර්. ගුණවර්ධන,
අධිකරණ අමාත්‍යාංශයේ වැඩබලන ස්ථිර ලේකම්

1962 සැප්තැම්බර් මස 5 වෙනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේදීය.

9-633

---

## 1962 අංක 397

අංකය : ඒ. ජේ. 2/8/57.

අග්‍රාණ්ඩුකාර උතුමාණන්වහන්සේ ගරු අධිකරණ අමාත්‍යවරයා කෙරෙහි පවරා ඇති බලතල අනුව එතුමා විසින්—

(1) ජේ. එෆ්. දේවපුර මහතා කොළඹ අධිකරණ දිස්ත්‍රික්කය වෙනුවෙන් සමාදාන විනිශ්චයකරුවකු වශයෙන් ද,

(2) වෛද්‍ය එච්. ඒ. රහමාන් මහතා ගාල්ල අධිකරණ දිස්ත්‍රික්කය වෙනුවෙන් සමාදාන විනිශ්චයකරුවකු වශයෙන් ද,

(3) එල්. ආර්. උක්කුබණ්ඩා මහතා කෑගල්ල අධිකරණ දිස්ත්‍රික්කය වෙනුවෙන් සමාදාන විනිශ්චයකරුවකු වශයෙන් ද,

(4) එම්. කේ. එම්. බුහාරි හාජියාර් මහතා කෑගල්ල අධිකරණ දිස්ත්‍රික්කය වෙනුවෙන් සමාදාන විනිශ්චයකරුවකු වශයෙන්ද,

(5) එස්. කේ. එස්. පෙරේරා මහතා කෑගල්ල අධිකරණ දිස්ත්‍රික්කය වෙනුවෙන් සමාදාන විනිශ්චයකරුවකු වශයෙන් ද

පත්කර ඇත්තේ ය.

ඩී. ජේ. ආර්. ගුණවර්ධන,
අධිකරණ අමාත්‍යාංශයේ වැඩබලන ස්ථිර ලේකම්.

1962 සැප්තැම්බර් මස 17 වැනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේදීය.

9-790

---

## 1962 අංක 398

අංකය : සී. 32/රෙක්ර්.

### නිලධාරීන් උසස් කිරීම්—රාජකීය ලංකා නාවික හමුදාව

1962 ජූලි මස 1 වැනි දින සිට ලයිතන්වරුන් (සැ) හැටියට:—

උප ලයිතන් (සැ) ආර්. එස්. ජයතිලක—රා.ලං.නා.හ.
උප ලයිතන් (සැ) පී. එම්. තාඹුගල—රා.ලං.නා.හ.

මො. වි. ජේපා. අබයකෝන්,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ
වැඩබලන ස්ථිර ලේකම්.

1962 සැප්තැම්බර් 12 වෙනිදා,
කොළඹ දීය.

9-796

### 1962 අංක 399

ලංකා සිවිල් සේවාවේ පහත සඳහන් පත්වීම් පහත දක්වා ඇති දිනවල පටන් වලංගුවේ:—

අංක. 74/2/2 (ඇම් ඇ:ජ්).

අයි. ඕ. කේ. ජී. ප්‍රනාන්දු මහතා 1962 අගෝස්තු මස 29 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු ප්‍රවාහණ සහ රජයේ වැඩ අමාත්‍යාංශයේ සහකාර ලේකම් වශයෙන් වැඩ බැලීමට.

අංක. 74/2/210 (ඇම් ඇ:ජ්).

ජේ. ජේ. රාජනායගම් මහතා 1962 අගෝස්තු මස 27 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු මහා භාණ්ඩාගාරයට අනුයුක්තව සිටීමට.

ඇන්. බී. ඇම්. සෙනෙවිරත්න මහතා 1962 අගෝස්තු මස 29 වැනි දින සිට කර්මාන්ත, ස්වදේශ හා සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයට අනුයුක්තව සිටීමට.

හෙ. ජිනදාස,
වැඩබලන භාණ්ඩාගාරයේ ලේකම්.

මුදල් අමාත්‍යාංශය,
කොළඹ,
1962 සැප්තැම්බර් මස 15.

9-751

---

### 1962 අංක 400

### පත්කිරීම්

වාණිජ, වෙළඳ, ආහාර හා නැව් කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා විසින්, වැඩබලන නියෝජ්‍ය රේගු අයකැමි හා ගොඩබෑම් සමීක්ෂක තැන්පත් සිවිල් නිලධාරි එච්. එස්. වනසිංහ මහතා, 1962.8.1 වැනි දින සිට ස්වකීය රාජකාරිවලට අතිරේකව, ආනයන හා අපනයන සහකාර පාලක වරයෙකු වශයෙන් පත්කරන ලදී.

කේ. අල්වාපිල්ලේ,
වාණිජ, වෙළඳ, ආහාර හා නැව් කටයුතු පිළිබඳ,
අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

කොළඹ,
1962.9.11.

9-745

---

## ආණ්ඩුවේ නිවේදන

අ. ආ. කා. අංකය : ඕ. 437/56.

චීන මහජන සමූහාණ්ඩුවේ සුවිශේෂ හා පූර්ණ බලැති තානාපති වශයෙන් ලංකාවේ පෙනීසිටීමට බලය පවරනු ලැබූ, ෂියේ කේ—ෂී උතුමාණන්ගේ අක්ත පත්‍රය, නෛකශ්‍රීන් විරාජමාන මහා රාජෝත්තමින් වහන්සේ වෙනුවෙන්, අග්‍රාණ්ඩුකාරතුමා සතුටින් භාර ගත්හ.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

සී. ජ. වල්පිට,
අග්‍රාණ්ඩුකාරතුමාගේ ලේකම්.

1962 සැප්තැම්බර් 15 වැනි දින,
කොළඹ, අග්‍රාණ්ඩුකාරතුමාගේ කාර්යාලයේදී.

9-759

---

### බන්ධනාගාර ආඥාපනත

වර්‍ෂ 1939 අංක 53 දරණ ආඥාපනතින් සංශෝධනය කොට වර්‍ෂ 1947 සැප්තැම්බර් 24 වැනි දින අංක 9,773 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද ප්‍රකාශයෙන් වෙනස් කර ඇති (44 වැනි පරිච්ඡේදය වන) බන්ධනාගාර ආඥාපනතේ 32 (1) (ආ) දරණ වගන්තියේ ප්‍රකාර, මෙහි උප ලේඛනයේ II වැනි තීරයේ සඳහන් තැනැත්තන්, මෙම දැන්වීමේ සඳහන් දින සිට තුන් අවුරුදු කාලයකට උපලේඛනයේ I වැනි තීරයේ සඳහන් ආයතනයේ ප්‍රාදේශීය සෝදිසි කොමිටියේ සාමාජිකයන් වශයෙන්, කර්මාන්ත, සවදේශ හා සංස්කෘතික කටයුතු භාර ගරු ඇමතිවරයා විසින් පත් කොට තිබේ.

වී. එල්. වීරසිංහ,
කර්මාන්ත, සවදේශ හා සංස්කෘතික කටයුතු
භාර අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් වෙනුවට.

1962 සැප්තැම්බර් මස 10 වැනි දින,
කොළඹ 7,
කර්මාන්ත, සවදේශ හා සංස්කෘතික
කටයුතු භාර අමාත්‍යාංශය.

#### උපලේඛනය

| I | II |
|---|---|
| අළුත් කඩේ බන්ධනාගාරය. | 1. එච්. ජී. ඇරැව්වල මහතා.<br>2. ඇම්. එච්. ඇම්. දාහලාන් මහතා.<br>3. සිරිල් පී. මලර් මහතා |

9-641

---

### බන්ධනාගාර ආඥාපනත

වර්‍ෂ 1939 අංක 53 දරණ ආඥා පනතින් සංශෝධනය කොට වර්‍ෂ 1947 සැප්තැම්බර් 24 වැනි දින අංක 9,773 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද ප්‍රකාශයෙන් වෙනස් කර ඇති (44 වැනි පරිච්ඡේදය වන) බන්ධනාගාර ආඥාපනතේ 32 (1) (ආ) දරණ වගන්තියේ ප්‍රකාර, මෙහි උප ලේඛනයේ II වැනි තීරයේ සඳහන් තැනැත්තිය, මෙම දැන්වීමේ සඳහන් දින සිට තුන් අවුරුදු කාලය කට, උපලේඛනයේ I වැනි තීරයේ සඳහන් ආයතනයේ ප්‍රාදේශීය සෝදිසි කොමිටියේ සාමාජිකාවක වශයෙන්, කර්මාන්ත, ස්වදේශ හා සංස්කෘතික කටයුතු භාර ගරු ඇමතිවරයා විසින් පත් කොට තිබේ.

වී. එල්. වීරසිංහ,
කර්මාන්ත, ස්වදේශ හා සංස්කෘතික කටයුතු භාර
අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1962 සැප්තැම්බර් මස 14 වැනි දින,
කොළඹ 7,
කර්මාන්ත, ස්වදේශ හා සංස්කෘතික කටයුතු
භාර අමාත්‍යාංශය,

#### උපලේඛනය

| I | II |
|---|---|
| වතුපිටිවල තරුණ වරද කරුවන්ගේ අභ්‍යාස විද්‍යාලීය බන්ධනාගාරය. | සී. ආර්. ඩයස් බණ්ඩාරනායක මහත්මිය. |

9-698

---

### 1957 තේ 48 වෙනි අංකය දරණ මෝටර් ගමනාගමන පනත

#### 25 (1) වෙනි වගන්තිය යටතේ කරන නියෝගයයි

කම්කරු හා ජනසතු සේවා පිළිබඳ අමාත්‍ය ධුරන්ධර මයිකල් පෝල් ද සොයිසා සිරිවර්ධන වන මම, මේ සමග ඇති උප ලේඛනයෙහි දක්වා ඇත්තාවූද, ලංකා ගමනාගමන මණ්ඩලයේ කටයුතු සඳහා අත්කර ගැනීමට යෝජනා කර ඇත්තාවූද, නිශ්චල දේපල අත්කර ගැනීම, 1957තේ 48 වෙනි අංකය දරණ මෝටර් ගමනා ගමන පනතේ 25 වෙනි වගන්තියේ (1) වෙනි උප වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල පිට, මෙයින් අනුමත කරමි.

එම්. පී. ද සොයිසා සිරිවර්ධන,
කම්කරු හා ජනසතු සේවා පිළිබඳ ඇමති.

1962ක්වූ අගෝස්තු මස 29 වෙනි දින,
කොළඹදීය.

#### උපලේඛනය

1. සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, කඩවත සහ මැද කෝරලේ ප්‍රාදේශීය ආදායම් නිලධාරී කොට්ඨාශයේ, බලන්ගොඩ පළාත් ආණ්ඩු සභා සීමාව තුල, බලන්ගොඩ කඩ වීදි ප්‍රදේශයේ පිහිටි, දළ වශයෙන් පර්චස් 2.5 පමණවූ බිම් කැබැල්ල.

2. උතුරට, නැගෙනහිරට සහ බස්නාහිරට එම ඉඩමේ ඉතිරි කොටස. දකුණට, වාරිමාර්ග ඇළ සහ පළාත් ආණ්ඩු සභාවේ විදුලි බල මධ්‍යස්ථානය.

3. අත්කර ගැනීමට ඇති ඉඩම් කැබැල්ලේ විස්තර මෙසේය:—

ඉඩමේ නම: මහකුඹුර; වගාව: මුඩුබිම; වර්ග ප්‍රමාණය: දළ වශයෙන් පර්චස් 2.5ක් පමණ; අයිතිවාසිකම් කියන්නන්ගේ නම් සහ ලිපිනය: ඇස්. ආර්. ඇලපාත කුමාරිහාමි, ඇල්පිටිය, ගොඩකවෙල; ඒ. ඇ:ජ්. මොලමුරේ, රත්නපුරය; පී. වේළු පිල්ලේ, පරණපාර, බලන්ගොඩ.

9-817

## 1957 තේ 48 වෙනි අංකය දරණ මෝටර් ගමනාගමන පනත

### 25 (1) වෙනි වගන්තිය යටතේ කරන නියෝගයයි

කම්කරු හා ජනසතු සේවා පිළිබඳ අමාත්‍ය ධුරන්ධර මයිකල් පෝල් ද සොයිසා සිරිවර්ධන වන මම, මේ සමග ඇති උප ලේඛනයෙහි දක්වා ඇත්තාවූද, ලංකා ගමනාගමන මණ්ඩලයේ කටයුතු සඳහා අත්කර ගැනීමට යෝජනා කර ඇත්තාවූද, නිශ්චල දේපල අත්කර ගැනීම, 1957තේ 48 වෙනි අංකය දරණ මෝටර් ගමනා ගමන පනතේ 25 වෙනි වගන්තියේ (1) වෙනි උප වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල පිට, මෙයින් අනුමත කරමි.

ඇම්. පී. ද සොයිසා සිරිවර්ධන,
කම්කරු හා ජනසතු සේවා පිළිබඳ ඇමති.

1962ක්වූ සැප්තැම්බර් 14 වෙනි දින,
කොළඹදීය.

උපලේඛනය

වයඹ පළාතේ, හලාවත දිස්ත්‍රික්කයේ, උතුරු පිටිගල් කෝරලේ ප්‍රාදේශිය ආදායම් නිලධාරී කොට්ඨාශයේ, හලාවත පළාත් ආණ්ඩු සභා සීමාව තුල, හලාවත පිහිටි, දළවශයෙන් රූඩ් 3ක් පමණවූ වරිපනම් අංක 64/395 දරණ ඉඩම් කැබැල්ල.

2. උතුරට, නැගෙනහිරට සහ දකුණට එම ඉඩමේ ඉතිරි කොටස : බස්නාහිරට, පුත්තලම-හලාවත ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ පාර.

3. අත්කර ගැනීමට ඇති ඉඩම් කැබැල්ලේ විස්තර මෙසේය :—

ඉඩමේ නම : සිංහපුර වත්ත (කොටසක්) ; වගාව : මුඩුබිම ; වර්ග ප්‍රමාණය : දළ වශයෙන් රූඩ් 3ක් පමණ ; අයිතිවාසිකම් කියනු ලබන්නාගේ නම සහ ලිපිනය : ඇල්. කදිර්ගාමන් පිල්ලේ, 91, බාන්ස් පෙදෙස, කොළඹ 7.

9-816

---

## ඉන්දියානු ආගාමික කම්කරු මණ්ඩලය

ගරු කම්කරු හා ජනසතුසේවා ඇමතිතුමා විසින් (III වන පරිච්ඡේදය වන) ඉන්දියානු ආගාමික කම්කරු ආඥා පනතේ 9 (1) වන වගන්තිය යටතේ 62. 9. 1 වන දින සිට තුන් වර්ෂයක කාල සීමාවක් ඉන්දියානු ආගාමික කම්කරු මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් සේවය කිරීම සඳහා එන්. එල්. ඒ. ද මෙල් මහතා පත් කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

වී. ඇස්. ඇම්. ද මෙල්,
ස්ථිර ලේකම්,
කම්කරු හා ජනසතුසේවා අමාත්‍යාංශය.

1962 සැප්තැම්බර් මස 13 දින,
කොළඹ දීය.

9-752

---

ඇල්.ඩී—බී. 17/62.

## 1962 අංක 25 දරන රක්ෂණ පාලන පනත

### 1 වැනි වගන්තිය යටතේ ආඥාව

වාණිජ, වෙළඳ, ආහාර හා නැව් කටයුතු පිළිබඳ ඇමති, ටිකිරි බණ්ඩාර ඉලංගරත්න වන මම, 1962 අංක 25 දරන රක්ෂණ පාලන පනතේ 1 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ඉහත කී පනත ක්‍රියාත්මක විය යුතු දිනය වශයෙන් 1962 නොවැම්බර් 1 වැනි දින මෙම ආඥාවෙන් නියම කරමි.

ටී. බී. ඉලංගරත්න,
වාණිජ, වෙළඳ, ආහාර හා නැව් කටයුතු
පිළිබඳ ඇමති.

1962 සැප්තැම්බර් 14 වැනි දින,
කොළඹ

9-659/1

---

ඇල්.ඩී—බී. 17/62.

## 1962 අංක 25 දරන රක්ෂණ පාලන පනත

වාණිජ, වෙළඳ, ආහාර හා නැව් කටයුතු පිළිබඳ ඇමතිවරයා විසින්, (2 අධිකාරය වන) අර්ථ නිරූපණ ආඥා පනතේ 12 වැනි වගන්තිය සමඟ කියවන ලද 1962 අංක 25 දරන රක්ෂණ පාලන පනතේ 76 වැනි වගන්තිය යටතේ, වාණිජ අධ්‍යක්ෂක සිය රාජකාරිවලට අතිරේකව රක්ෂණ පාලක වශයෙන් 1962 නොවැම්බර් 1 වැනි දින සිට වලංගුවන සේ පත්කර ඇත.

කෝ. අල්වාපිල්ලෙ,
වාණිජ, වෙළඳ, ආකාර හා නැව් කටයුතු
පිළිබඳ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1962 සැප්තැම්බර් මස 14 වැනි දින,
කොළඹ.

9-659/2

---

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## අංක 37/62 දරන ආනයන පාලන දැන්වීම

### ආනයන

කවර රටකින් වුවද පහත සඳහන් බඩු ආනයනයට පෞද්ගලික ආනයන බලපත්‍රයක් දැන් අවශ්‍ය බව ආනයනකයන් වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ. අසීමිත සාමාන්‍ය බලපත්‍ර මත හා සාමාන්‍ය ආනයන බලපත්‍ර මත සිදු කෙරෙන ආනයනයනට මින් පසු ඉඩ නොලැබේ.

(1) කේක් හා වෙනත් බේකරි නිෂ්පාදන (ළදරු හා ආතුර ආහාර හැර),
(2) කේජු,
(3) මාජරින්,
(4) අච්චාරු හා චට්නි වර්ග ඇතුළු සුරක්ෂිත ආහාර,
(5) එළවළු (අලුත් හෝ සීත කරන ලද),
(6) අයිස්-ක්‍රීම්,
(7) පළතුරු (අලුත් හෝ සීත කරන ලද),
(8) සුරුට්ටු,
(9) දුංකුඩු,
(10) අලුත් මල්,
(11) අලුත් පැල, මුල්, ගස් හා රිකිලි (කෘෂිකර්මය සඳහා නොවූ)
(12) පිගන් ගඩොල් හා එවැනි දෑ,
(13) දියමන්ති කුඩු,
(14) ගෘහ භාණ්ඩ හා ඒවායේ කොටස් (යකඩ හෝ වානේ ඇඳන් හා ස්ප්‍රින් මෙට්ට හැර),
(15) විදුලි ලාම්පු හා ලන්තෑරුම් (ගෘහ) හා ඒවායේ කොටස්,
(16) සියලුම වර්ගයේ විදුලි ලාම්පු හා ලන්තෑරුම් සඳහා චිමිනි, ග්ලෝබ් හා ෂේඩ්,
(17) ක්ලෝරින්,
(18) ඉවතලන කඩදාසි හා පරණ කඩදාසි,
(19) බිත්ති කඩදාසි,
(20) දින දර්ශන,
(21) බයිසිකල් කොටස් : සීට් කවර, බ්‍රේක් කෑලි, පැඩල් කෑලි, පැඩල් කවර, හැන්ඩල් ක්ලිප්, බා කවර හා ස්ටෑන්ඩ්,
(22) ට්‍රේස්, වැගන් හා තේ ට්‍රොලි (ගෘහ),
(23) වලලු හා පබලු,
(24) පිළිම හා සුරුවම්,
(25) ස්වර්ණාභරණ හා ට්‍රින්කට් පෙට්ටි,
(26) පින්තූර පෝස්ට් කාඩ්,
(27) බුමුතුරුණු හා බිමට එලන දෑ (ලිනෝලියම් හා එබඳු නිෂ්පාදන),
(28) සුවඳ විලවුන්,
(29) ප්ලාස්ටික් පනා,
(30) සබන් පෙට්ටි හා සබන් බන්දේසි,
(31) පනා, පියර මල්, බුරුසු හා සබන් සහිත ටොයිලට් සෑට්,
(32) බෝල් පොයින්ට් පෑන් සහ කූරු දමන පැන්සල් හා ඒවායේ කොටස්,
(33) සිනමා පට හා ස්ලයිඩ්ස් ඇතුළු ප්‍රචාරක භාණ්ඩ. (නොමිලේ ආනයන කරන ලද වෙළඳ දැන්වීම්, කැටලොග්, ෂෝ කාඩ්ස්, ෂෝ-ප්ලේට්ස් හා රාමු හැර),
(34) පෞරාණික දේ,
(35) ගුදිරි, මෙට්ට, කොට්ට හා කුෂින්,
(36) පාත්‍රා, වාස්, බන්දේසි,
(37) සිගරැට් (හෝ සුරුට්ටු) ලයිටර් හා ඒවායේ කොටස්,

(38) සිගරැට් කේස් හා සුරුට්ටු පෙට්ටි,

(39) අරුම පුදුම හෝ අද්භූත දේවල් හා එවැනි දේ,

(40) ප්ලාස්ටික්, විනිල්, පොලිතීන් හෝ එවැනි ද්‍රව්‍යයන්ගෙන් නිමවූ ගෘහ හා විසිතුරු භාණ්ඩ,

(41) හඳුන් කූරු,

(42) ලැකර් භාණ්ඩ, ක්‍රිස්ටල් වීදුරු බඩු හා ඇත් දත් භාණ්ඩ,

(43) අලංකාර ඵලක, බන්දේසි හා තැටි ඇතුළු බිත්ති සැරසිලි,

(44) පික්නික් සැට්,

(45) මුද්‍රිත හා මල් වැඩ දැමූ ප්ලාස්ටික් සීට්,

(46) කෑම සඳහා නොවන තිරිසන් සතුන් හා කුරුල්ලෝ, සහ

(47) අව්වට පළඳින කන්නාඩි.

2. පාලකගේ මනාපය පරිදි බලපත්‍ර නිකුත් කරනු ලැබේ. ඉහත සඳහන් කර ඇති සමහර විෂයයන් සඳහා ආනයන කොටස් නිකුත් කිරීම පසුව දැනුම් දෙනු ලැබේ.

3. සියලුම නොනිමි ඇණවුම් පිළිබඳව 1962 ජූනි 25 වෙනි දින අංක 13,184 දරන ගැසට් අති විශේෂයෙහි පළවූ අංක 19/62 දරන ආනයන පාලන දැන්වීම කෙරෙහිත් 1962 සැප්තැම්බර් 1 වෙනි දින අංක 13,283 දරන ගැසට් අති විශේෂයෙහි වූ අංක 36/62 දරන ආනයන පාලන දැන්වීම කෙරෙහිත් ආනයනකයන්ගේ අවධානය යොමු කරනු ලැබේ.

සී. මයිල්වාගනම්,
ආනයන හා අපනයන පාලක.

1962 සැප්තැම්බර් මස 15 වෙනි දින,
කොළඹ දීය.

9-815/1

---

## අංක 38/62 දරන ආනයන පාලන දැන්වීම

### තෑගි සහ වෙළඳ සැම්පල් ආනයනය

පුද්ගලික ආනයන බලපත්‍රය යටතේ ඇති බඩු, තෑගි හෝ වෙළඳ සැම්පල් වශයෙන් කවර රටකින් හෝ ගෙන්වීම සඳහා මෙම දෙපාර්තමේන්තුවේ පූර්ව අනුමැතිය අවශ්‍ය බව වෙළෙඳ මහතුන්ගේ සහ සාමාන්‍ය මහජනයාගේ දැනගැනීම සඳහා මෙයින් නිවේදනය කැරෙයි.

විදේශීය විනිමය වියදමක් සම්බන්ධ නැතිව ගෙන්වන බඩු සඳහා වුවද මේ ආනයන පාලන ක්‍රියා මාර්ගය අදාළ වෙයි.

සී. මයිල්වාගනම්,
ආනයන හා අපනයන පාලක.

1962 සැප්තැම්බර් 15 වැනි ද,
කොළඹ දීය.

9-815/2

---

## අංක 39/62 දරන ආනයන පාලන දැන්වීම

### සිමෙන්ති ආනයනය

1962 පෙබරවාරි 23 වැනි දින අංක 12,928 දරණ ආණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළවූ අංක 5/62 දරන ආනයන පාලන දැන්වීම සම්බන්ධයෙනි. සිමෙන්ති ආනයනය සඳහා ඉන්ඩෙන්ට්-වලට අද සිට බලපත්‍ර නිකුත් කරනු ලබන්නේ "මැට්‍රික් ටොන් 1 කට මිල, රක්ෂණය හා නැව් ගාස්තු වට්ටාකම රු. 85/-ක්" වන පදනම මත බැව් සාමාන්‍ය දැනගැනීම සඳහා නිවේදනය කැරෙයි. අංක 5/62 දරන ආනයන පාලන දැන්වීම එලෙසින් සංශෝධනය කැරෙයි.

සී. මයිල්වාගනම්,
ආනයන හා අපනයන පාලක.

1962 සැප්තැම්බර් 15 වැනි ද,
කොළඹ දීය.

9-815/3

---

## පිස්සුබලු ආඥාපණතේ 476 වැනි පරිච්ඡේදයේ II වැනි වගන්තිය යටතේ කරනු ලබන ප්‍රකාශනයයි

ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ ගම්බද පළාත්වල පිස්සුබල්ලන්ගෙන් අනතුරු ඇතිවිය හැකි බැව් ම විසින් පිළිගැනෙන බැවින්, ත්‍රිකුණාමල නගර සභා ප්‍රදේශයෙන් බාහිර මුළු දිස්ත්‍රික්කයම, පිස්සු බලු උවදුර පවතින හෝ උවදුර පැතිරීමට ඉඩ ඇති ප්‍රදේශ ලෙස, 1962 ඔක්තෝබර් මස 1 වැනි දින සිට, පිස්සු බලු ආඥාපණතේ 476 වැනි පරිච්ඡේදයේ II වැනි වගන්තිය යටතේ ප්‍රකාශයට පත් කරනු ලබන බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

2. කිසියම් ප්‍රසිද්ධ ස්ථානයක, පාරක හෝ පුද්ගලික ගොඩනැගිල්ලක්, මිදුලක්, ගෙවත්තක් නොවන අන් සෑම ස්ථානයකම සිටින, බැඳ නොතබන ලද හෝ කැටුව නොයනු ලබන සෑම බල්ලකුම එවක් පටන් විනාශ කරනු ලැබීමට ඉඩ තිබේ.

ඩී. එම්. ඒ. ස්පෙල්ඩවින්ඩ්,
ත්‍රිකුණාමලයේ දිසාපති.

කච්චේරිය,
ත්‍රිකුණාමලය,
1962 සැප්තැම්බර් 21 වැනි දින දීය.

9-740

---

## පිස්සු බලු උවදුර

මොණරාගල දිස්ත්‍රික්කයේ, මොණරාගල, වැල්ලවාය, වෙල්ලස්ස හා බින්තැන්න පත්තුව යන ප්‍රාදේශීය ආදායම් නිලධාරී කොටස් තුළ සිටින බල්ලන් ජලභීතිකා රෝගයෙන් පෙළෙන බැව් ඒත්තු ගොස් ඇති හෙයින්, එම කොට්ඨාශ පිස්සු බල්ලන් පිළිබඳ ආඥාපණතේ 333 වැනි පරිච්ඡේදයේ 11 වැනි වගන්තිය යටතේ, 1962 සැප්තැම්බර් 1 වැනි දින සිට සමසක කාලයක් ගතවන තුරු පිස්සු බලු රෝගයට යටත් ප්‍රදේශ හැටියට ප්‍රකාශ කරමි.

2. මෙසේ ප්‍රකාශයට පත් කරන ලද පෙදෙස් තුළ නොබඳින ලද හෝ අල්ලා නොගෙන යන බල්ලන් හා ගෙදරක, මිදුලක හෝ වත්තක හැර ප්‍රසිද්ධ ස්ථානයක, පාරක හෝ වෙනයම් ස්ථානයක සිටින බල්ලන් විනාශ කිරීමට හැකි බව දැනුම් දෙමි.

ස. දේ. සපරමාදු,
මොණරාගල දිස්ත්‍රික්කයේ දිසාපති.

1962 අගෝස්තු 29 වැනි දින,
මොණරාගල දිසාපති කායනීලයේ දීය.

9-824

---

## දැන්වීමයි

මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ උඩබුලත්ගම කරවන ආදායම් පාලක නිලධාරී කොඨාශයේ නාවලපිටිය පළාත් ආණ්ඩු සභාව තුළ ගවයින් අතර "මුව සහ කුර" නමැති රෝගය පැතිරී යන බැව් 1957 අංක 33 දරණ (සතුන්ගේ) බෝවෙන රෝග සම්බන්ධ (සංශෝධිත) ආඥාපණතේ 327 වැනි පරිච්ඡේදයේ 4 වැනි වගන්තියේ (1) අතුරු වගන්තිය යටතේ මා විසින් වෂී 1962 අගෝස්තු මස 17 වැනි දින අංක 13,263 දරණ ලංකාණ්ඩුවේ ගැසැට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද දැන්වීම, අද දින සිට අවලංගු වන බව මහජනයාට මෙයින් දැනුම් දෙමි.

අබේරත්න බණ්ඩාරනායක,
රජයේ ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරී.

1962 සැප්තැම්බර් 15 වැනි දින,
පේරාදෙණියේ, රජයේ ප්‍රධාන පශු වෛද්‍ය
නිලධාරි තැනගේ කායනීලයේ දීය.

9-760

## ගමනාගමනය සඳහා වසා තැබීම

### නැගෙනහිර කොට්ඨාශය—කල්මුනේ දිස්ත්‍රික්කය

### අක්කරෙයිපත්තු-සගාමම් පාරේ අංක 41/1 දරන පාළම

නැගෙනහිර කොට්ඨාශයේ, අක්කරෙයිපත්තු-සගාමම් පාරේ අංක 41/1 දරන පාළම අළුත්වැඩියා කිරීම සඳහා 62.10.1 වැනි දින සිට මාස 2ක කාලයකට වසා තබන බව මෙයින් දන්වා සිටිමි. මෙකී පාර වෙනුවට කොළඹ-රත්නපුර-වැල්ලවාය-මඩකලපුව පාර ඔස්සේ ගමන් කළ හැකිය.

මෙල්සන් ප්‍රනාන්දු,
රජයේ වැඩ අධ්‍යක්‍ෂ වෙනුවට.

ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුව.
කොළඹ,
1962 සැප්තැම්බර් 17 වනදා.

9-785

## රථ වාහන ගමනා ගමනයට බාධා—කළුතර දිස්ත්‍රික්කයේ හොරණ-අළුත්ගම පාරේ අංක 13/10 දරන පාළම

ඉහත සඳහන් පාළම නැවත දන්වන තුරු රථ වාහන ගමන් කළ නොහැකි වන සේ වසා තබනු ලැබේ.

නාතුපාන-වරකාගොඩ හරහා මාගී ඒ වෙනුවට යොදා ගත හැකි මාගීය වන්නේ ය.

ඒ. සී. පෙරේරා,
රජයේ වැඩ අධ්‍යක්ෂ වෙනුවට.

1962 සැප්තැම්බර් මස 15 වෙනි දින,
කොළඹ, රජයේ වැඩ කාර්යාලයේදීය.

9-818

---

සෑම සිකුරාදා දිනයකම ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියකදීම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

ගැසට් පත්‍රය පළ කරන දින සිට කාර්යාලය වැඩ කරන දින හතරකට ප්‍රථම පස්වරු 3·30 ට සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි (සාමාන්‍ය වශයෙන් සඳුදා පස්වරු 3.30 ට ප්‍රථමයෙන්).

ගැසට් පත්‍රය ලබාගැනීම සඳහා දායකමුදල් කොළඹ, මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙලින්ම ගෙවිය යුතුය. ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දායකමුදල් භාරගනු නොලැබේ.

---

ලංකාවේ වාලච්චේනයෙහි පිහිටි "ඊස්ටර්න් පේපර් මිල්ස් කෝපරේෂන්" හි නිපදවන ලද කඩදාසිවල
ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රාපිතයි